# 2018 පෙබරවාරි මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්

**"ක්‍රිස්තුන් ජේසුන් වහන්සේ තුළ පැවති ජීවිතාකල්පයම ඔබ තුළත් පවතීවා "**
(පිලිප්පි 2:5)

ජේසු ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතාකල්පය වූයේ අබ්බා පියාණන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්තට ඉඩ දී ඔවුන් වහන්සේගේ හඬට සවන් දෙමින්, යාච්ඤාවෙන් ද, කඳුළු සැලීමෙන් ද යක්ෂයා, ලෝකයා, මාංශය නමැති සියළු සතුරු බලවේගයන්ගෙන් මිනිසා ආරකෂා කර, මුළු මිනිස් සංහතියට ස්වර්ගයට ඇතුළු වීමට දොරටු විවෘත කර දීමට දායක වීමයි.

ඒ කර්තව්‍ය පූර්ණවත් කිරීමට එතුමන්ගේ දුක් විඳිම, මරණය සහ උත්ථානය වීම තුළින් මුළු මිනිස් සංහතියටම වාසනාව උදා විය.

අයැදීම් සේවකයන් වශයෙන් මේ මාසය පුරාවටම ජේසු ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතාකල්පය අපගේ ආකල්පය කරගෙන ශුද්ධාත්මයාණන්ගේ සහය ඇතිව යක්ෂයා, ලෝකයා, මාංශය යටවී සිටින මුළු මිසින් සංහතිය වෙනුවෙන් මොරගසමින්, යාච්ඤා කරමින් ඊට සාක්ෂි දරමින් ඉදිරියට යෑමට පෙරමුණ ගනිමු.

***එමෙන්ම අපගේ අයැදීම් එකතුවලදී පුබුදු දිවැසි එකතුව මේ කාලයේ ආරම්භ කර ඇති 2018 ජනවාරි මස 07දා සිට 2018 අප්‍රියෙල් මස 01 දින (පාස්කු ඉරිදා දක්වා) පෙ.ව.06.00 සිට රාත්‍රි 10.00 දක්වා කෙරෙන භාග්‍යවන්ත අම්මා සමග මැදිහත් වි කෙරෙන දම්වැල් යාච්ඤාව සහය කර ගනිමු. (කාලය අනුව පුබුදු ජපමාලය හෝ සාමාන්‍ය ජපමාලය උදව් කර ගනිමු.)***

**" මන්ද අපගේ සටන මිනිස් සතුරන්ට විරුද්ධව නොව, අධිපතිකම් වලටත්, පරාක්‍රමධාරීන්ටත්, මේ අන්ධකාර ලෝකයේ මුලාදෑනීන්ටත් ස්වර්ගීය ස්ථානවල සිටින සතුරු දුෂ්ඨ බලවේගයන්ටද විරුද්ධවය.** (එපීස 5:12)

**මැදිහත් යැදුම :**

* නමස්කාරය
* විශ්වාස ලක්ෂණය
* පළමු පංතිය - දේව සේවක තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් ශුද්ධවරයට ඔසවාලීම සඳහා
* දෙවන පංතිය - අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ඇතුළු රදගුරු මණ්ඩලය සහ සියළුම පූජාප්‍රසාදිවරුන් වෙනුවෙන්.
* තෙවන පංතිය - ස්වාමි තාත්තා ඇතුළු දිවැසි එකතුව වෙනුවෙන්.
* සතරවන පංතිය - සියළුම පුබුදු නායකත්වය වෙනුවෙන්.
* පස්වන පංතිය - මුළු මහත් ජනතාවගේ පුබුදු ගමන වෙනුවෙන් හා මනස්ථාපනයේ වසර හතර වෙනුවෙන්.

පළමු සතිය : දිව්‍යමය කියවීම - පිලිප්පි 2:1-11
අයැදීමට විශේෂ යොමුව :

* පළමු ඉරුදින පැවැත්වෙන සාංඝික පවුල් දිනය හා වචනයේ සේවකයන් වෙනුවෙන්
* පෙබරවාරි 02 වන දින පැවැත්වෙන ස්වාමි තාත්තාගේ පූජකවර සංවත්සර දිනය වෙනුවෙන්
* පෙබරවාරි 10 වන දින පැවැත්වෙන පළාත් පාලන මැතිවරණය තුළ සාමකාමී මැතිවරණයක් සහ දූෂිතයෙන් තොර සුදුසු අපේක්ෂකයන් පත්වන පිණිස
* වෙනත් අයැදීම් .....

දෙවන සතිය : දිව්‍යමය කියවීම - පිලිප්පි 1:27-29
අයැදීමට විශේෂ යොමුව :

* පෙබරවාරි 14 වන දින අළු බදාදායින් ඇරැඹෙන චතාරික සමය ගැඹුරු පශ්චත්තාපයෙන් සහ මනස්ථාපනයෙන් ගත කිරීමට සමස්ථ කිතුනු ජනතාවටම ශුද්ධාත්ම වරම් ලැබෙන පිණිස
* වෙනත් අයැදීම් .....

තෙවන සතිය : දිව්‍යමය කියවීම - පිලිප්පි 3: 7-11
අයැදීමට විශේෂ යොමුව :

අනගාරික දූත සේවාවේ යෙදෙන අනගිික කණ්ඩායම් වෙනුවෙන් (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් ......

සතරවන සතිය : දිව්‍යමය කියවීම - පිලිප්පි 5:12-17
අයැදීමට විශේෂ යොමුව :

දේශය මුල් කරගෙන (විනාඩි 20ක් පමණ)

වෙනත් අයැදීම් ....

වෙනත් විශේෂ අයැදීම් :
* පසුගියදා අප අතරින් දෙව්මව් තරුලට ගිය මාරවිල ශ්‍රාවක සංඝයේ අයැදීම් එකතුවලට සම්බන්ධව සිටි මර්ලින් අම්මාගේ ආත්මය වෙනුවෙන්.
* 2018 ජනවාරි 07 වන දින සිට කුරණ බෝලවලාන සදාසරණගම දේවමාතා දෙව්මැදුරේ ආරම්භ කර ඇති පුබුදු පිවිසීම් කථා මාලාවට සහභාගි වන ජනතාව සහ වචනයේ සේවකයන් වෙනුවෙන් *
සහයක එකතුවට සම්බන්ධව කටයුතු කරන ඉරණවිල ප්‍රේමසිරි තාත්තා පත් වී ඇති රෝගී තත්ත්වයෙන් දිව්‍යමය සුවය ලැබෙන පිණිස සහ දිගුකලක් රෝගී තත්ත්වයෙන් පසුවන ඔහුගේ භාර්යාව වෙනුවෙන් .
* 2018 ජනවාරි 14 - 2019 ජනවාරි 20 දක්වා කොළඹ අගරදගුරු පදවිය දියත් කර ඇති "මාගේ හදවතට ප්‍රසන්න එඬේරුන් මම ඔබට දෙන්නෙමි" යන තේමාව ඔස්සේ ආරම්භ කර ඇති යහපත් එඬේරාගේ වර වෙනුවෙන්.

"මාගේ නාමය දරණ මාගේ සෙනග බැගෑපත් වී යාච්ඤා කර, මා සොයා තමන්ගේ නපුරු මාර්ග අතහැරියොත් මම ස්වර්ගයේ සිට එය අසා, ඔවුන්ගේ පව් කමා කොට ඔවුන්ගේ දේශයට සෙත සලසන්නෙමි. "

(2 වංශාවලිය 7:14)

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

****************************